# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**

**2020.06.07**

කර්තෘ

ලංකා සී නිව්ස් ආයතනය,

පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂවරයා ලෙස **2020** ජුනි **03** වන දින මා විසින් ලබාදුන් මාධ්‍ය සාකච්ඡාවේදී මාධ්‍ය වේදියෙකු ඇසූ ප්‍රශ්නයකට මා විසින් ලබාදුන් පිළිතුරෙහි කොටස් වශයෙන් ගෙන සංස්කරණය කරන ලද ප්‍රකාශයක් ඔබගේ වෙබ් අඩවියෙහි පළකර ඇති බව මා වෙත දැන ගන්නට ලැබී ඇත. ඔබගේ මාධ්‍යවේදීන් එකී ප්‍රකාශනය සංස්කරණය කිරීමේදී මාගේ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම විකෘති වී ඇති බව කණගාටුවෙන් දැනුම් දෙමි.

මා වෙත යොමුකළ එක් ප්‍රශ්නයක් වූයේ මෙය ජනතාව ඉල්ලූ මැතිවරණයක් ද යන්නයි. මාගේ පිළිතුර වූයේ මෙය ජනතාව ඉල්ලූ මැතිවරණයක් නොවන බවත් එසේ ඉල්ලීම අනවශ්‍ය බවත් ය. මෙය ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයාට ලැබී තිබෙන බලතල අනුව අනිවාර්යයෙන්ම පැවැත්විය යුතු මැතිවරණයක් බවත් එය කිසිවෙකු ඉල්ලීම අනවශ්‍ය බවත් ය. එහි මුල් වදන් කිහිපයක් පමණක් උපුටා ගැනීම මගින් අර්ථය විකෘති භාවයට පත් වී ඇත.

මාගේ සම්පූර්ණ කථාවේ හරය වූයේ කොරෝනා තත්ත්වය තුළ අනෙකුත් සියලු කටයුතු අපි සිදු කරන්නේ නම් මැතිවරණය ද ඒ ආකාරයටම සෞඛ්‍ය උපදෙස්වලට අනුගතව පැවැත්විය යුතු බවත් එහිදී ජනතාවගේ ජීවිත අවධානමකට ලක් නොවන ආකාරයට එය සිදුකළ යුතු බවත් ය. ඒ අනුව මැතිවරණය ක්‍රියාත්මක වෙද්දී නැවත කොරෝනා තත්ත්වය උත්සන්න වුවහොත් ඒ පිළිබඳ මැතිවරණ කොමිෂමට තීන්දුවක් ගත හැකි බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස පාර්ලිමේන්තුව නැවත කල් ගියහොත් ඒ පිළිබඳව අවශ්‍ය නම් ගරු ජනාධිපතිවරයා ට සලකා බැලිය හැකි බවත්ය. කිසිදු විටක පාර්ලිමේන්තුව නැවතත් කැඳවිය යුතුයි යනුවෙන් මා ප්‍රකාශ කර නැත. එහෙත් ඔබගේ වෙබ් අඩවිය තුළ මා එවැනි ප්‍රකාශයක් කළ බවද සඳහන් වේ.

මැතිවරණ වෙනුවෙන් පෙනී සිටින සංවිධානයක් ලෙස කිසිවිටෙක අප මැතිවරණවලට එරෙහි වී ඇති සංවිධානයක් නොවන බව සහ මැතිවරණ කඩිනමින් පවත්වන ලෙස ඉල්ලා අධිකරණය ඉදිරියට ගිය සංවිධානයක් බව ඔබද හොඳින් දැනුවත් ඇතැයි සිතමි. කොවිඩ් තත්ත්වය තුළ පවා අපගේ අදහස වූයේ සෞඛ්‍ය ක්‍රමවේද අනුගමනය කරමින් මැතිවරණ පැවැත්විය යුතු බවය.

එබැවින් කරුණාකර මෙය නිවැරදි කරන ලෙස ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ.

පිටපත් 1. ගරු සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
2. දේශපාලන පක්ෂ ලේකම්වරුන්

# No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2 558 570 / 11 2 558 571 Fax: (+94) 11 2 558 572
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk